# සමාජ ස්තරායනය සහ අධ්‍යාපනය

එච්.ජී.සී. සම්පත්

## හැඳින්වීම

ඕනෑම සමාජයක පුහුදුන් මිනිසා මූලිකව ම අපේක්ෂිත අවශේෂ සාධක ත්‍රිත්වයකි. ඒ දේපළ හා සේවාවන්හි අයිතිය බලය හා නම්බුව හෙවත් සමාජ ගරුත්වය යි. අතීතයේ මෙන් ම වර්තමානයේ ද කිසිදු සමාජයක සාමාජිකයන් හට ඉහත අපේක්ෂාවන් සමානව සාක්ෂාත් නොවුනි. ආර්ථික, දේශපාලන, සමාජීය, ස්ත්‍රී පුරුෂ, ග්‍රාමීය නාගරික, වාර්ගික හා සංස්කෘතික හේතූන් පදනම් කර ගනිමින් සමාජයකින් ප්‍රදර්ශනය වන මෙම අසමානතා සමාජ ස්තරායනය යනුවෙන් අදහස් වේ. ඕනෑ ම සමාජයක ඉහළ සිට පහළට හෙවත් සිරස් අතට ස්තර වෙන්වීමක් ප්‍රදර්ශනය වේ. ලබන වරප්‍රසාද, අවස්ථා, ප්‍රතිලාභයන්ට සාපේක්ෂව සමාජයේ ඉහළ ස්තරයන් හි සාමාජිකයන් වැඩි සමාජ වටිනාකම් හිමි කර ගන්නා අතර පහළ ස්තරයන් හි සාමාජිකයෝ බොහෝ දුෂ්කරතාවන් අත් විඳිති.

සමාජ ස්තරායනය කවරේදැයි පුළුල් ව හඳුනා ගැනීමට දෙස් විදෙස් ප්‍රාමාණික වියතුන්ගේ නිර්වචන කිහිපයක් පළමුව සලකා බලමු.

යම් සමාජ කණ්ඩායමක් සතුවන ධනය, කීර්තිය හා බලය අනුව එක් කණ්ඩායමක් තවත් එකකට වඩා ඉහළින් හෝ පහළින් තරා කරනු ලබන සමාජ කණ්ඩායම්වල පැවැත්ම සමාජ ස්තරායනයෙන් අදහස් කෙරේ (ගලගම, 2015, 75).

> "සමාජ ස්තරායනය යනු පුද්ගලයන් හෝ කණ්ඩායම් විවිධ සමාජ ධූරාවලීන් මත බලය වෙනස්වීම හෝ තත්ත්වයන් වෙනස්වීම මත නම්බුව හෝ ගරුත්වය වෙනස්වීම අනුව වෙන් කිරීමක් ලෙස දැක්විය හැකිය. ලිංගිකත්වය, ආගම,

ජාතිය සහ ජනවාර්ගිකත්වය මත පදනම්ව බෙදීම් නිතර සිදු වුවත් සමාජ අසමානතාවයන් අනෙක් ප්‍රවේශවලට දමා වර්තමාන ප්‍රවේශය විශාල වශයෙන් අවධානය යොමු කරනුයේ සමාජ, ආර්ථික අසමාන තත්ත්වයන් වෙතය"

(Andersen, 2018 : 68).

"යම් සමාජයක සිටින සාමාජිකයන් වර්ග කර අගය කිරීමේ මිනුමක් සහ සාපේක්ෂ ලෙස සමාජය පිළිගත් වැදගත් අංශවලින් උසස් හා පහත් ලෙස සැලකීම සමාජ ස්තරායනයයි"

(Parsons, 1958).

''පොදු වශයෙන් රැකියාව, වයස, අධ්‍යාපනය අතින් සමාන වූ ජීවන පුරුදු, අදහස් හා හැඟීම්, චර්යාවන් අතින් සමාන වූ පුද්ගල සමූහය සමාජ පන්තියක් හෙවත් සමාජ ස්තරයක් වේ''

(Ginsberg, M.).

සමාජ ස්තරායනය යනුවෙන් අදහස් කරන්නේ සමාජය තුළ සිටින පුද්ගලයන් එක් එක් කණ්ඩායම්වලට ඔවුන්ගේ සමාජ, ආර්ථික කරුණු එනම් ධනය, ආදායම, ජාතිය, අධ්‍යාපනය, වාර්ගිකත්වය, ලිංග භේදය, වෘත්තිය, සමාජ තත්ත්වයන් හෝ උපයාගත් බලය (සාමාජීය හෝ දේශපාලන) පදනම් කර ගෙන වර්ගීකරණයකට ලක් කිරීම යි. එසේ වුවත් සමාජ ස්තරායනය යනු සමාජ කණ්ඩායම්වල හෝ භූගෝලීය ප්‍රදේශයක් තුළ හෝ සමාජ ඒකකයක සිටින මිනිසුන්ගේ සාපේක්ෂ සමාජ තත්ත්වයන් වශයෙන් දැක්විය හැකි ය.

සංකීර්ණ සමාජයන් ස්තරගත වී ඇති අතර පන්ති හෝ තත්ත්ව කණ්යම් ධුරාවලියකට බෙදී ක්‍රමානුකූල විචල්‍යයන් පවතින සම්පත් අගයන් සහ ජීවන රටාවන් පෙන්වති (Langman, 1987, Chap:9). මේ අනුව සමාජ ස්තරගත වීම යන පදය තත්ත්වයක් සහ ක්‍රියාවලියක් යන දෙකම විස්තර කිරීම සඳහා යොදාගනු ලැබෙන්නක් ලෙස හඳුනා ගත හැකි ය. සමාජ ස්තරගත වීම තත්ත්වයක් ලෙස සඳහන් වනුයේ ජනගහනයක සාමාජිකයින්ට ඇති ගති ලක්ෂණ, ඒවා ප්‍රමිතීන්ට හෝ පවත්නා තත්ත්වයන්ට වෙන් කොට හඳුනා ගැනීම වේ.

සමාජ ස්තරගත වීම ක්‍රියාවලියක් ලෙස සඳහන් වනුයේ සමාජයක ජනතාව සාමාජිකයන් වශයෙන් ස්තරගත වීම ය. මේ අනුව සමාජ ස්තරායනය යන්න ඒ ඒ මිනිස් සමාජයේ අඩුවැඩි වශයෙන් පවතින අනිවාර්ය, සංකීර්ණ තත්ත්වයක් ලෙස හඳුනාගත හැකි ය.

**01. සමාජ ස්තරායනයෙහි ලක්ෂණ**

අතීත මිනිසා මෙන් ම වත්මන් ගෝලීය මිනිසා ද ඒ ඒ සමාජ සමූහයන්ට අදාල ජීවන රටාවන් උප සංස්කෘතීන් හා පොදු අනන්‍යතාවන් ගරු කරති. විවිධතා ආරක්‍ෂා කරති. නිපුණතා ඇති කරති. සමාජ ස්තරයන්හි පැවැත්ම ද ඉන් සුරක්ෂිත කරති. සමාජ ස්තරායනයෙහි පවතින මෙම ස්වභාවය මත ඊට අනන්‍යව ගොඩනැගුණු ලක්‍ෂණ රැසකි. සමාජය යම් ධූරාවලියකට අනුව බෙදී පැවතීම, එක් ස්තරයක් අනෙක් ස්තරයට වඩා උසස් හෝ පහත් කොට සැලකීම, දිගු ඉතිහාසයක් පැවතීම, විශ්ව ව්‍යාප්තව පැවතීම මෙන් ම සමාජීය සංකල්පයක් වීම ඉන් කිහිපයකි.

මෙල්වින් ටියුමින් (1999) ට අනුව සමාජ ස්තරායනයෙහි ලක්‍ෂණ පහකි.

1. පුරාතන බව - Ancient
2. සාර්වත්‍රවර්ති බව - Ubiquitous
3. සමාජීය රටාවක් තිබීම - Socially Patterned
4. විවිධත්වයක් ඇති වීම - Diverse
5. ප්‍රබල ප්‍රතිඵල පැවතීම - Far reaching consequences

ලෝකයේ ඕනෑම සමාජයක් පැවැත්ම සඳහා ප්‍රධාන මූල ධර්මයන් සහිතව ව්‍යූහගත වී ඇති අතර සුවිශේෂී ව්‍යූහයක් ඉන් ක්‍රියාත්මක වේ. මූලික වශයෙන් ව්‍යූහයන් 4ක් ක්‍රියාත්මක බව වටහාගත හැකි ය.

1. සමාජ ජීව විද්‍යාත්මක ව්‍යූහය - Socio-biological structure

2. ප්‍රතිමාන හෝ සම්මතයන් පිළිබඳ ව්‍යූහයන් (විධිමත් හා අවිධිමත්) The structures of norms (Formal and informal)

3. ආර්ථික ව්‍යූහය - Economic structure

4. අවිධිමත් ව්‍යූහය - The informal structure (Paola, 2013 : 83)

සමාජ ස්තරායනයෙහි තවත් පොදු අංග ලක්ෂණ කිහිපයක් ගලගම දක්වයි.

1. සමාජ ප්‍රභේදනය

2. තරාතිරම තීරණය කිරීම

3. අගය කිරීම

4. පාරිතෝෂණය (ගලගම, 2005 : 76).

මේ අනුව පෙනී යන්නේ ස්තරායනය සමාජීය ලක්ෂණයක් බව යි. සමාජයේ සෙසු සියලු ම අංශවලට එය සම්බන්ධ වන්නේ එබැවිනි. මෙම ලක්ෂණය ආයතනික අන්තර් යැපීම සහ ආයතනික අන්තර්ක්‍රියාකරණය (Institutional Interdependence and Institutional Relationship) වශයෙන් හඳුන්වනු ලබයි. ස්තරායනය සමාජීය ලක්ෂණයක් වන බැවින් ඊට අදාළ සාධකයන් වන පවුල, විවාහය, ආර්ථිකය, අධ්‍යාපනය, දේශපාලනය, ආගම හා සංස්කෘතිය ඒ කෙරෙහි බලපවත්ව යි. එහෙත් මෙම ස්වභාවය ස්තරායනයේ සමාජීය ලක්ෂණයක් මිස පෞද්ගලික වෙනස්කම් ප්‍රතිබිම්භනය කිරීමක් නොවන බව (ජයසේන, 2010) ඇතැම් විද්වත්හු දක්වත. කෙසේ වුව ද මෙම ලක්ෂණයන් ඈත අතීතයේ සිට ම විවිධ ප්‍රමාණයන්ගෙන් සෑම සමාජයක ම යථාර්ථවාදී ලෙස ක්‍රියාත්මකව පැවති බව සඳහන් කළ හැකි ය.

## 2. සමාජ ස්තරායනය පිළිබඳ එළඹුම්

විවිධ වෙනස්කම් සහිත සමාජ ස්තරායනය පිළිබඳ ප්‍රවේශ කිහිපයකි. විවිධ සමාජ දර්ශනයන්ට අනුව විවිධ ප්‍රවේශයන් හි විවිධත්වයක් දැකිය හැකි ය.

### 2. 1. කෘත්‍යවාදී එළඹුම

සමාජය ස්තර වශයෙන් වෙන්ව පැවතීම පිළිබඳ ප්‍රතිජනනාත්මක නැතහොත් කෘත්‍යාත්මක මෙහෙයක් ඇතැයි දක්වන අදහස කෘත්‍යවාදී එළඹුමෙන් ප්‍රකට කරයි. ඒ අනුව සමාජ ස්තරායනය කෘත්‍යවාදීන් හඳුනා ගන්නේ සමාජයක විවිධ වූ කෘත්‍යමය අවශ්‍යතා නිසා ගොඩනැගෙන්නක් ලෙස ය. ධනවාදී ක්‍රමය ආරක්ෂා කර ගැනීමට අදහස් ඉදිරිපත් කළ කෘත්‍යවාදීහු සමාජ ස්තරායනය සමාජ පැවැත්මට අත්‍යාවශ්‍ය බව පෙන්වා දුන්හ. කිංස්ලි ඩේවිස් හා විල්බට් මුවර්ට අනුව සමාජ ස්තරායනය සමාජයේ පැවැත්මට හා ක්‍රියාකාරීත්වයට වැදගත් කෘත්‍යක් ඉටු කරයි. එක් සමාජ පන්තියක පැවැත්ම අනෙක් සමාජ පන්තියක් මත රඳා පවතියි. ධනපති පන්තියක් සමාජය තුළ පවතින්නේ නිර්ධන පන්තියක් පවතින නිසා ය. ස්ත්‍රී පුරුෂ පුද්ගල කොටස් ද්විත්වය සමාජ පැවැත්මට අත්‍යවශ්‍ය ය. ටැල්කොට් පාසන්ස්ට අනුව ස්තරායනය යනු පොදු වටිනාකම් පද්ධතියකට අනුව සමාජ පද්ධතියේ ඒකක ස්තරගත කිරීමකි. සමාජයේ පැවැත්මට එය ඉවහල් වේ යැයි ඔහු පැවසීය (Parsons, 1958 : 16).

### 2. 2. සට්ඨනවාදී එළඹුම

කෘත්‍යවාදී ප්‍රවේශයට ප්‍රතිවිරුද්ධ ප්‍රවේශය වේ. කාල් මාක්ස් (Carl Marx) යනු ස්තරායනය පිළිබඳ සට්ඨනවාදී එළඹුම ඉදිරිපත් කළ ප්‍රමුඛයා ය. බලය හිමි හා අහිමි වශයෙන් ඕනෑම සමාජයක පන්ති දෙකක් පවතී. එම පන්ති දෙක අතර පවතින ගැටුම පන්ති රහිත සමාජයක් ඇති කරයි, යනු ඔහුගේ මතයයි. සෑම අවස්ථාවක ම ආර්ථික සාධකය මත බලය ඇති පන්තිය විසින් බලය නැති නිර්ධන පන්තිය සූරා කෑමකට ලක්වන බව ඔහු ප්‍රකාශ කළේ ය. ඒ අනුව ස්තරායනය යනු සමාජ මූලයේ ඇති බෙදීමක් බැවින් සූරා කන්නන් හා සූරා කෑමට ලක් වන්නන් අතර ගැටුමෙහි ප්‍රතිඵලයක් ලෙස ස්තරායනයෙන් තොර සමාජයක් නිර්මාණය වන බව වැඩි දුරටත් පෙන්වා දෙයි.

## 2.3. බහු විචල්‍ය එළඹුම

ස්තරායනය පිළිබඳ බහු විචල්‍ය එළඹුමෙහි ප්‍රමුඛයා ජර්මානු ජාතික සමාජ විද්‍යාඥ මැක්ස් වෙබර් (Max Weber) ය. ඔහු මාක්ස්ගේ පන්තිය පිළිබඳ විග්‍රහය පිළිගනිමින් නව අර්ථකථනයක් ඉදිරිපත් කරයි. නූතන කාර්මික සමාජවල ක්‍රියාත්මක වන ස්තරායන අංග තුනක් ඔහු පෙන්වා දෙයි.

1. බලය හෝ ආධිපත්‍යය
2. තත්ත්ව සමූහ හෝ ගරුත්වය
3. සමාජ පන්තිය හෝ ආර්ථික ශක්තිය

මෙමගින් ආර්ථික, සාමාජීය, දේශපාලන වැනි බහුමාන සිද්ධාන්තයක් දක්වා ඇත (ගලගමගේ, 2005, 86). අප ජීවත්වන සමාජය තුළ ආර්ථිකය, දේශපාලනය හා අධ්‍යාපනය මත ගොඩනැගුනු බලයක් දැකිය හැකි ය. ඒ අනුව ධනය, බලය හා තත්ත්වය සමාජයක ජීවත්වන පුද්ගලයා කෙරෙහි ඍජුව බලපෑම් කරයි. දේපළ හා ඉපැයීම්, ජීවන ශෛලිය මෙන් ම වෘත්තීය මතත් සමාජ පන්තිය හා ගරුත්වය තීරණය වේ. Theory of Social and Economic Organization කෘතියේ දී මැක්ස් වෙබර් පෙන්වා දෙන්නේ සමාජ ගරුත්වය සාධක හතරක් මත තීරණය වන බවයි.

1. උප්පත්තියට ආවේණික ගෞරවය
2. අධ්‍යාපනයට ඇති ගෞරවය
3. ජීවන ශෛලියට ලැබෙන ගෞරවය
4. රැකියාවට ලැබෙන ගෞරවය (M. Weber - 2009 - books. google.com)

උපත ලැබූ කාලය හෝ පවුල, අධ්‍යාපනය ලැබූ ආයතන, ජීවන රටා අනුගමනය හා නියුක්ත රැකියාව සමාජ ගරුත්වය කෙරෙහි බලපානු ලබයි.

## 2.4. සුවිශේෂී වරණීය එළඹුම

ඉහත සියලු ප්‍රවේශයන් හි සාරය එක් තැන් කොට ගොඩනැගූ ප්‍රවේශයකි. මෙහි නිර්මාපකයා ගර්හාඩ් ලෙන්ස්කි (Gerhard Lenski) ය. මිනිසාගේ අසීමිත අවශ්‍යතා මත සීමිත සම්පත් අසීමිතව හිමිකර ගැනීමට යත්න දැරීම මත ගැටීම් ඇතිවන බවත් සමාජ අසමානතාවයට කෘත්‍යවාදී බලපෑමක් පවතින බවත් මෙම න්‍යාය පෙන්වා දෙයි. එහෙත් ඊට බලපාන සෙසු සාධක රැසක් ද ඇති බව වැඩිදුරටත් පෙන්වා දෙයි. නිදසුන් ලෙස සමාජ ඉතිහාසයේ බලපෑම දැක්විය හැකි ය. දඩයම් යුගයේ දී අතිරික්ත නිෂ්පාදනයක් නොවූ බැවින් ස්තරායන ක්‍රමයක් බිහි නොවුණ ද ගොවි කර්මාන්ත දියුණුව සමග අතිරික්ත නිෂ්පාදනය ධනය බවට පත්වීම මත සමාජ ස්තර නිර්මාණය වීම වැළැක්විය නොහැකි විය. කාර්මික දියුණුවත් සමග සමාජ ස්තර බිහිවීමට පුද්ගල දක්ෂතා ද හේතු වී තිබේ. මේ අනුව සමාජ විකාශය සමග බලපැවැත් වූ විවිධ සාධක මත සමාජ ස්තරායනයේ සුවිශේෂත්වයන් ද ප්‍රදර්ශනය වී තිබේ.

## 3. ස්තරායනයෙහි ස්වභාවය

අතීතයේ සිට වර්තමානය දක්වා පැවති හා පවතින සෑම සමාජයක ම කුමන හෝ ස්තරායන ක්‍රමයක් ප්‍රකට ය. සමාජයේ සැකැස්මට හා ස්ථාවරත්වයට සමාජය විසින් ම නිර්මාණය කරගත් සමාජ ස්තරායනය හේතු වී ඇති බව ද ඉන් පැහැදිලි ය. සමාජ ස්තරායනයෙහි පවතින ක්‍රියාකාරී ස්වභාවය මත ලෝකයේ සමාජ ප්‍රධාන කොටස් දෙකකට වර්ග කෙරේ.

1. ආවෘත (Closed) සමාජ
2. විවෘත (Open) සමාජ

ආවෘත සමාජයක සාමාජිකයා හට තමාට උරුම වූ සමාජ ස්තරය වෙනස් කිරීමට අවශ්‍ය වුව ද ඊට අවස්ථා ඉතා අල්ප පිරිසකි. කුල ක්‍රමය, වහල් ක්‍රමය හා වැඩවසම් යුගයන් හි ආවෘත සමාජ ලක්ෂණ පැහැදිලි ව දැකිය හැකි විය. පුද්ගල කුසලතා මත පදනම්ව තමන්ට හිමි සමාජ ස්තරය තීරණය කිරීමට අවකාශ සැලසෙන

සමාජ විවෘත සමාජ ලෙස සැලකේ. අතීතයේ සිට ස්තරායන රටාවල ස්වභාවය හා ප්‍රමාණයෙහි ද වෙනස්කම් දැකිය හැකි ය. සියලු දෙනාට සමාන බලය, දේපළ හා නම්බුව අයත් වීම හා නොවීම යන දෙඅන්තය මත සමාජය විකාශය වී තිබේ. ඇරිස්ටෝටල් යුගයේ දී ඉතා පොහොසත්, මධ්‍යම හා දුප්පත් ලෙස සමාජය ස්තර තුනකට බෙදී තිබේ. එම සමාජයේ සිට වර්තමානය තෙක් විවිධ සමාජයන් හි විවිධ ස්තරායන ක්‍රම ක්‍රියාත්මක වේ (ගලගම, 2005:80). උප කුල (Sub-castes) පන්දහසකටත් වැඩි සංඛ්‍යාවක් ඇති ඉන්දියාව වැනි රටක් නියෝජනය කරනුයේ අසමානතා කැපී පෙනෙන සමාජයක් වන අතර ඊශ්‍රායලයේ කිබ්බුට්ෂි (Kibbutzi) නියෝජනය කරනුයේ සමානත්වයෙන් අනූන වූ සමාජයකි.


මේ අනුව සමාජ ස්තරායනය විෂයෙහි දිගු ඉතිහාසයක් පවතින අතර වර්තමානය දක්වා එය විවිධ වෙනස්කම්වලට බඳුන් වෙමින් විකාශය වී ඇති බවත් හඳුනාගත හැකි ය. පන්තිය, කුලය, බලය වැනි වචන සමාජයේ විවිධ මට්ටම් පෙන්නුම් කිරීමට යොදාගන්නා නිර්ණායක වී තිබේග විවිධ සමාජයන්ට හා කුලයන්ට සාපේක්ෂව ස්තරායන ක්‍රමයේ සුවිශේෂතා ද විශද වේ.

### 4. සමාජ ස්තරායනය හා අධ්‍යාපනය

අධ්‍යාපනය සමාජ සචලනය විෂයෙහි බලපාන ප්‍රධාන සාධකයකි. එනම් පුද්ගලයාට ජීවිත අවස්ථා ලබා දෙන ප්‍රධාන ම සාධකය අධ්‍යාපනය යි. ලබන අධ්‍යාපනයේ ස්වභාවය අනුව බලය, ගෞරවය හා ආදායමක් ලබා ගත හැකි තත්ත්වයට ළඟා වීමට හැකි වන අතර මෙම හේතුව නිසා නවීන ස්තරායන පද්ධතිය කෙරෙහි බලපාන ප්‍රබල සාධකයක් වශයෙන් අධ්‍යාපනය කෙරෙහි අවධානය යොමු කිරීම අවශ්‍ය වේ (ජයසේන, 2010 :182). සමාජ ස්තරායනයේ දී ඉහළ ස්තරවලට විඳින්නට ඇති දුෂ්කරතා අවම වෙයි. ඊට සාපේක්ෂව පහළ ස්තරවල සාමාජිකයින්ට විඳින්නට සිදු වන දුෂ්කරතා අධික ය. පහළ සමාජ ස්තරයක සාමාජිකයන් හට ඉහළ සමාජ ස්තරයක් කරා සචලනය වීමට හා දුෂ්කරතා අවම කර ගැනීමට ඇති ප්‍රධානත ම මාර්ගය අධ්‍යාපනය යි. එමගින් පැහැදිලි වන්නේ අධ්‍යාපනය හා සමාජ ස්තරායනය අතර අන්‍යෝන්‍ය වශයෙන් සබඳතාවක් ඇති බවයි. (රංජන්, 2013:97)

## 4. 1. අධ්‍යාපනය හා සමාජ ස්තර අතර අන්‍යෝන්‍ය බලපෑම

අධ්‍යාපනය හා සමාජ ස්තර යනු විචල්‍යයන් දෙකකි. මෙම විචල්‍යයන් එකිනෙක කෙරෙහි අන්‍යෝන්‍ය වශයෙන් සිදුකරන බලපෑම සමාජයෙන් ප්‍රදර්ශනය වේ.




කලාපයෙන් කලාපයට, රටින් රටට, පළාතෙන් පළාතට හා සමාජයෙන් සමාජයට පවා සමාජ ස්තරායනය කෙරෙහි අධ්‍යාපනය බලපාන ආකාරයෙහි වෙනසක් දැකිය හැකි ය. විවෘත සමාජවල පුද්ගලයෙක් ලබන අධ්‍යාපනය අනුව ඔහුගේ රැකියාව, ආදායම, විවාහය, සමාජ තත්ත්වය ආදිය තීරණය වේ. හොඳ අධ්‍යාපනයකින් පහළ සමාජ ස්තරයේ පුද්ගලයෙකු ඉහළ අවස්ථාවන්ට සුදුසුකම් ලබමින් උඩුකුරු සමාජ සචලනයට යොමු විය හැකි ය. අනෙක් අතට අධ්‍යාපනය සාර්ථක නොවීම නිසා ඉහළ ස්තරයකට හිමිකම් කියන අයෙකු වුව ද සුදුසුකම් නොමැති වීමෙන් යටිකුරු සමාජ සචලනයකට ලක්වීම නොවැළැක්විය හැකි ය.

තමා නියෝජනය කරන සමාජ ස්තරය අනුව හිමිවන අධ්‍යාපනික අවස්ථා ද තීරණය කෙරේ. අධ්‍යාපන ක්‍රියාවලියට සම්බන්ධ වන ආකාරයෙහි විවිධත්වයක් ද පවතියි. නිදසුන් ලෙස විවෘත සමාජයන්හි දෙමාපියන්ගේ ආර්ථික, සමාජ, සංස්කෘතික ප්‍රාග්ධනය අනුව අධ්‍යාපනය ලැබීමේ විෂමතා දැකිය හැකි ය. එක්සත් රාජධානිය, ඇමෙරිකාව වැනි බටහිර රටවල මෙන් ම ඉන්දියාව, ලංකාව වැනි දකුණු ආසියාතික රටවල පවා මෙම විෂමතාව දැකිය හැකි ය. දැඩි නීති රීති මගින් සමාජ ස්තරායනය පාලනය කරනු ලබන සමාජවාදී රටවල ද මෙම විෂමතාව සපුරා වියැකී නොමැත. රේමන්ඩ් සහ වෙනත් අය (1998). චෙකෝස්ලෝවැකියාවේ සිදුකරන ලද අධ්‍යයනයකින් පෙන්වා දී ඇත්තේ පහළ සමාජ පන්තියට අධ්‍යාපන අවස්ථාවලින් යම් සේවයක් සැලසෙන්නේ වරප්‍රසාද ලත් අය භුක්ති විඳීමෙන් පසුව උතුරා යන දෙයින් පමණක් බවයි. පැරණි ශ්‍රී ලාංකික සමාජයේ කුල ස්තරායනය දැඩිව පැවති නමුත් බුදු සමයේ

බලපෑම සමග අධ්‍යාපන අවස්ථා සාමාන්‍ය ජනතාව අතරට විහිද යාම සහ අධිරාජ්‍යවාදී පාලන තන්ත්‍රයත් සමග කුල ස්තරායනය පන්ති ස්තරායනයක් බවට පත් වූ බවත් ප්‍රදර්ශනය වේ. වෙසෙසින් අධිරාජ්‍යවාදී බලපෑම මත සිංහල රදල පිරිස ඉහළ සමාජ පන්තිය ලෙසත් ඉඩම් හිමි ගොවියන් මධ්‍යම පන්තිය ලෙසත් ඉන්දීය වතු කම්කරුවන්ගේ පැමිණීමත් සමග කම්කරු පන්තියක් ලෙසත් සමාජ පන්ති නිර්මාණය විය. 1977 විවෘත ආර්ථිකයේ සම්ප්‍රාප්තියත් සමග අධ්‍යාපනික අවස්ථා ව්‍යාප්ත වුව ද වර්තමානය වන විටත් ලාංකීය සමාජ ස්තරායනයෙහි කැපී පෙනෙන සාධක ලෙස ස්ත්‍රී පුරුෂ භාවය, කුලය, වාර්ගිකත්වය, රැකියා ගරුත්වය, බලය ආදිය දැක්විය හැකි ය.

අධ්‍යාපනය සමාජ ස්තර කෙරෙහිත් සමාජ ස්තර අධ්‍යාපනය කෙරෙහිත් අන්‍යෝන්‍ය වශයෙන් පවත්වන බලපෑම මත දැකිය හැකි ප්‍රධාන ලක්ෂණ දෙකක් (ගලගම, 2005 : 159) මෙසේ දක්වයි.

1. ලබන අධ්‍යාපනය අනුව සමාජ ස්තර ඉහළ යාම හෝ පහළ යාම.
2. පවුලේ සමාජ ස්තරය අනුව ඉහළ අධ්‍යාපනයක් ළඟා කර ගැනීම හෝ පහළ අධ්‍යාපනයකින් සෑහීමකට පත් වීම.

මේ අනුව අධ්‍යාපනය හා සමාජ ස්තර යන විචල්‍යයන් විවිධ සමාජයන් හි ධනාත්මකව හා සෘණාත්මක ව ක්‍රියාත්මක බව හඳුනා ගත හැකි ය.

### 4. 2. සමාජ ස්තරායනය හා අධ්‍යාපන අවස්ථා

'මානවයාගෙන් ආරම්භ වූ සෑම උපක්‍රමයකට ම වඩා මිනිසුන්ගේ තත්ත්වයන් සමානාත්මක කිරීමට හා සමාජ යාන්ත්‍රණයේ සමතුලිතතාව ආරක්ෂා කරන චක්‍රය අධ්‍යාපනය වේ' යන හොරස් මැන්ගේ (Horace Mann) ප්‍රකාශය සමාජ ස්තරායනය හා අධ්‍යාපන අවස්ථාවන්ට අදාල වැදගත් අදහසකි. සෑම දෙයක් ම අධ්‍යාපනයට කළ හැකි ය, එබැවින් සැමට අධ්‍යාපනය ලබා දිය යුතු ය, එය ලොව සැමට අදාළ සම අයිතියකි. යන අදහස් ලොව පිළිගත් අදහස් ය. එහෙත් ප්‍රායෝගිකව සෑම සමාජයක ම යථාර්ථයක් නොවූ හා නොවන සංකල්පයක් ලෙස ද අධ්‍යාපනය හැඳින්විය හැකි ය.

සම අධ්‍යාපන අවස්ථා කෙරෙහි බලපාන සාධක රැසක් පර්යේෂකයෝ හඳුනාගෙන තිබෙති. නිදසුන් ලෙස පවුල් පසුබිම ප්‍රශස්ත වන විට අධ්‍යාපන ප්‍රාප්තිය ඉහළ යන බවත් පවුල් පසුබිම පහළ තලයක පවතින විට අධ්‍යාපන ප්‍රාප්තීන් අවම වන බවත් ජේ. ඩබ්. බී. ඩග්ලස් ඇතුළු පිරිස 1964 වර්ෂයේ දී බ්‍රිතාන්‍ය සමාජය ඇසුරින් සිදු කරන ලද පර්යේෂණයකින් සනාථ කොට තිබේ. ධනවත් පවුල්වල උපන් ළමයින් දුප්පත් දෙමාපියන්ගේ ළමයින්ට වඩා සෞඛ්‍ය සම්පන්නව හැදෙමින් ශාස්ත්‍රීය සාධනය ළඟාකර ගැනීමට ඇති අවස්ථා වැඩි ය. (රංජන්, 2013 :100) බ්‍රිතාන්‍ය අධ්‍යාපන අවස්ථා පිළිබඳ 1985 දී ඩග්ලස් විසින් සිදු කළ පර්යේෂණයක් මගින් ග්‍රැමර් පාසල් සඳහා පිවිසීමට ස්තරායනයේ පබලපෑම පහත පරිදි දක්වා තිබේ.

1. ඉහළ මධ්‍යම පන්තික දරුවන් 51%
2. ඉහළ කම්කරු පන්තික දරුවන් 21%
3. පහළ මධ්‍යම පන්තික දරුවන් 34%
4. පහළ කම්කරු පන්තික දරුවන් 2.2%

(රංජන්, 2013: 100)

අධ්‍යාපනය සඳහා ප්‍රවේශ වීමේ දී පමණක් නොව අධ්‍යාපන උපයෝජනයේ දී අධ්‍යාපන සාධනයේ දී හා ප්‍රතිලාභ ලැබීමේ දී ද බ්‍රිතාන්‍ය සමාජයේ පවා විෂමතා දැකිය හැකි ය. බ්‍රිතාන්‍යයේ ප්ලවුඩන් (1967) වාර්තාව මගින් දරුවාගේ අධ්‍යාපනයට සම්බන්ධ වන සාධක රාශියක් පෙන්වා දී තිබේ. ඒ අතර දෙමාපිය රැකියාව, අඩු ආදායම, පවුලේ සාමාජික සංඛ්‍යාව අධික වීම ඉන් කිහිපයකි. ගාල්ල අධ්‍යාපන දිස්ත්‍රික්කයේ ද්විතීයික අධ්‍යාපන අවස්ථා පිළිබඳ අධ්‍යයනයකින් දෙමාපිය රැකියාව හා මාසික ආදායම, අධ්‍යාපන මට්ටම, පවුලේ ප්‍රමාණය, සමාජ පරිසරය, දෙමාපිය අනුබලය, දෙමාපිය වෘත්තීය අපේක්ෂා ආදී සාධක සමග අධ්‍යාපන මට්ටම හා ස්වභාවය තීරණය වන බව හඳුනාගෙන ඇත (රංජන්, 2013: 103). සංස්කෘතික දරිද්‍රතා න්‍යායෙන් ද මෙම තත්ත්වය තහවුරු කොට තිබේ. සමාජවාදී රටක් වන චෙකෝස්ලෝවැකියාවේ පවා වරප්‍රසාද ලත් පවුල්වල මූල්‍ය ප්‍රාග්

ධනය හා සංස්කෘතික ප්‍රාග්ධනය දරුවන්ගේ අධ්‍යාපනයට බලපෑම් කරන අයුරු රේමන් සිං ඇතුළු (1998) පර්යේෂණ කණ්ඩායමක් විසින් පෙන්වා දී තිබේ. මෙම තත්ත්වය සම අධ්‍යාපන අවස්ථා සැපයීමේ පරමාර්ථයට ද ප්‍රබල අභියෝගයකි. සමාජ විෂමතා තුරන් කිරීම මෙයට අවශ්‍ය වැදගත් ම විසඳුම ලෙස ඉදිරිපත් වේ (ගලගම, 2005: 90).

## 4.3. අධ්‍යාපන ආයතන හා සමාජ ස්තරායනය

ලොව සංවර්ධිත මෙන් ම සංවර්ධනය වෙමින් පවතින බොහෝ රටවල අධ්‍යාපන ආයතන හා සමාජ ස්තරායනය අතර සම්බන්ධයක් දැකිය හැකි ය. ඉහළ සමාජ ස්තරය නියෝජනය කරන දරුවන්ට මුදල් අය කරන ඉහළ පහසුකම් සහිත උසස් අධ්‍යාපන ආයතන වෙන් වී ඇති අතර පහළ සමාජ ස්තර නියෝජනය කරන දරුවන් සඳහා නොමිලයේ අධ්‍යාපනය ලබා දෙන පහසුකම් අවම පහළ මට්ටමේ අධ්‍යාපන ආයතන වෙන් වී පවතී. එංගලන්තයේ විස්තීර්ණ පාසල්වලට වඩා ග්‍රැමර් පාසල්වලට ඇති ඉල්ලුම විශාල ය. ඔක්ස්බ්‍රිජ් වශයෙන් හඳුන්වන ඔක්ස්ෆර්ඩ් කේම්බ්‍රිජ් (Oxford, Cambridge) විශ්වවිද්‍යාලවලින් ලබා ගන්නා උපාධියට ලන්ඩන් විශ්වවිද්‍යාල උපාධියට වඩා ගෞරවයක් හා සැලකිල්ලක් විසි එක් වැනි ශත වර්ෂයේ ද ලැබෙන බව නොරහසකි. එමෙන් ම ඇමෙරිකාවේ ස්වැත්මෝර් (Swathmore) විද්‍යාලයකින් ලබන සහතිකය වෙනත් උසස් පාසලකින් ලැබෙන සහතිකයට වඩා සැලකිල්ලට පාත්‍රවන අතර අයිවිලීග් (Ivyleague) විශ්වවිද්‍යාල වශයෙන් හඳුන්වන ප්‍රින්ස්ටන් (Princeton) හෝ කොලොම්බියා (Coloumbia) විශ්වවිද්‍යාල සහතිකවලට වැඩිමනත් ගෞරවයක් හිමිවන බව ඔප්පු කිරීම පහසුය. (ජයසේන, 2010 (184) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ආයතන හා සමාජ ස්තරායනය අතර පවතිනුයේ ද මෙවන් ස්වභාවයක් ම ය. නාගරික හා ග්‍රාමීය ජනප්‍රිය පාසල් අතලොස්සක් සමාජයේ ප්‍රභූ පැලැන්තියට සේවය සලසන අතර සෙසු පාසල් පහළ සමාජ ආර්ථික තත්ත්වයක් ඇති පවුල්වල දරුවන්ට සේවය සලසනු ලබයි. ශ්‍රී ලංකාවේ පාසල්වලට පවතින ඉල්ලුම අනුව පාසල් වර්ගීකරණයක් අධ්‍යයනයක් ඇසුරින් රූපසිංහයෝ (2002) ඉදිරිපත් කරති.

1. නාගරික ජනප්‍රිය පාසල්

2. ප්‍රාදේශීය ජනප්‍රිය පාසල්

3. නගරාසන්න මධ්‍යම මට්ටමේ පාසල්

4. ගම්බද පාසල්

5. නගරබද දුප්පත් පාසල්

ඉහත පාසල්වලට පවතින ඉල්ලුම එම පාසල් පෝෂණය වන දරුවන්ගේ සමාජ ස්තරයට සාපේක්ෂව වෙනස් වේ. එනම් පාසල්වලට පවතින තරඟකාරීත්වයේ අනුපිළිවෙළට සමාජ ස්තරායනය ද පවතින බව රූපසිංහයෝ වැඩිදුරටත් පෙන්වා දෙති. පාසලට පවතින සමාජ පිළිගැනීම, ගරුත්වය හා පහසුකම් ලාංකික සමාජයේ බෙහෙවින් සලකා බලන කරුණකි. එම සාධකයන් අවම හා දුර්වල මට්ටමක පවතින පාසලට එම ප්‍රදේශයේ සමාජ, ආර්ථික හා දේශපාලන බලය හිමි පවුල්වල දරුවන් ඇතුළත් කිරීමට දෙමාපියන් මැලිකමක් දක්වන බව ශ්‍රී ලංකාවේ අවාසිදායක පරිසරයන් හි අධ්‍යාපන අවස්ථා පිළිබඳ අධ්‍යයනයකින් (රූපසිංහ, 1997 (15) තහවුරු කොට තිබේ. ගුණාත්මක විභේදනය මගින් ලබාගත් අධ්‍යාපන ප්‍රමාණයෙහි අසමානතාව ප්‍රතිස්ථාපනය කරයි (Arum et al, 2007 : 4). යන්න ඉහත කරුණු අනුව මනාව සනාත වේ.

## 4.4. ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය හා සමාජ තත්ත්වය

සමාජ තත්ත්වය තීරණය කෙරෙන සාධක රැසකි. ඉන් වඩාත් ප්‍රබල එක් සාධකයක් ලෙස අධ්‍යාපනය දැක්විය හැකි ය. ඉහළ වටිනා අවස්ථාවන් සහිත නිරපේක්ෂ හිඟකමට අධ්‍යාපනය යනු ස්ථායික වූ මනා විෂයකි. ඉන් ප්‍රභූ ආයතනවල ස්ථානයන් සහ ධාරාවන් හඳුනාගත හැකි සමාජ වාසි ප්‍රදානය කරයි (Marginsion (2016) Published online: 2). ශ්‍රී ලංකාවේ මෙන් ම සෙසු රටවල ද සාමාන්‍ය විශ්වාසය වී ඇත්තේ ජීවිත තත්ත්ව අධ්‍යාපනය හේතු කොටගෙන සංවර්ධනය කරගත හැකි බවත් උසස් සමාජ සචලතාවක් ලබා ගැනීමට එමගින්

අවස්ථාව උදාකර ගත හැකි බවත් ය (ජයසේන, 2010 ඃ 189). සමාජ තත්ත්වයේ හා ගරුත්වයේ ප්‍රමාණය, ලබන අධ්‍යාපනයට සාපේක්ෂව ගොඩනැගෙන්නේ සංස්කෘතික සාධක ද පදනම් කර ගනිමිනි. එම සංස්කෘතික සාධක එම රටේ ප්‍රජාව විසින් සම්මත කරගත් ඒවා වේ. මැක්ස් වෙබර්ට අනුව සමාජ තත්ත්වය විෂයෙහි බලපාන කරුණු කිහිපයකි.

1. පුද්ගලයා විසින් අනුගමනය කරනු ලබන ජීවන රටාව.

2. පුද්ගලයා ලබා ඇති අධ්‍යාපනයට හිමිවන ගරුත්වය.

3. ආරෝපිත තත්ත්වයට (පාරම්පරිකව එන) ලැබෙන ගරුත්වය.

4. රැකියාව මත ලැබෙන ගරුත්වය (ගලගම, 2005ඃ 73).

ඉහත සාධකයන්ගෙන් ආරෝපිත තත්ත්වය හැර සෙසු සියල්ල අධ්‍යාපනයෙන් හිමිකර ගනිමින් සුවිශේෂී සමාජ ගරුත්වයක් සාධනය කර ගත හැකි ය. එහෙත් ඉහළ පාසල් සංස්කෘතියක ඇසුර හා ඉහළ අධ්‍යාපනයක් ළඟාකර ගැනීමට පහළ සමාජ ස්තරයන්ට ලාංකික සමාජයේ තරමක් දුෂ්කර කාර්යයකි. නිදසුනක් ලෙස 1980 දශකයේ අගභාගයේ ශ්‍රී ලාංකික දේශපාලනයේ සිදු වූ විපරීත තත්ත්වයන් හමුවේ දේශීය විශ්වවිද්‍යාල වසා දැමූ විට ඇති හැකි දෙමාපියන්ගේ දරුවන් විදෙස් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කොට ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබා දී සමාජයේ ඉහළ තත්ත්වයන් හා ගරුත්වයන් උපයාගත් බව නොරහසකි. පහ වසර ශිෂ්‍යත්ව විභාගය හරහා පහළ සමාජ ස්තරයන් හි දරුවන්ට ඉහළ සමාජ ස්තරයකට නැගීමට පලංචියක් බැඳුන ද ඉන් උපරිම ඵල නෙළා ගැනීමට සියලු දෙනා අපොහොසත් වෙති. මේ අනුව ශ්‍රී ලාංකික සමාජයේ ඉහළ සමාජ තත්ත්වයක් උපයා ගැනීමට අධ්‍යාපනය බොහෝ දුරට හේතු වුව ද ඒ කෙරෙහි බලපාන සෙසු සාධක රැසක් පවතින අයුරු ද හඳුනාගත හැකි ය.

## නිගමන

මිනිසා විසින් පෞද්ගලික දේපළ, වටිනාකම් හා ගරුත්වයන් සිය ජීවිත සමග බද්ධ කර ගැනීමට ප්‍රයත්න දැරීමට සාපේක්ෂව සමාජ ස්තාරායනය ද ක්‍රමිකව වර්ධනය වී මිනිස් සමාජය තුළ ස්ථාවර වී තිබේ. එහිලා බොහෝ භෞතික හා අභෞතික සාධක රැසක් බලපෑම් කරන අතර ඊට සාපේක්ෂව සමාජ ස්තරායනයෙහි තීව්‍ර බවක් ඇතැම් සමාජයන් හි දැකිය හැකි වේ. විෂය මූල (Objective) හා මනෝ මූල (Subjective) වශයෙන් එම සාධක බෙදා දැක්විය හැකි ය. ඉන් ඇතැම් ඒවා උපතින් ම උරුම වූ ආරෝපිත (Ascribed) සාධක වේ. පුද්ගල විභව්‍යතා මත උපයා ගන්නා දෑ සාධිත (Achieved) සාධකයෝ වෙති. වර්තමානයෙහි ආරෝපිත සාධකයන් අභිභවනය කරමින් සාධිත තත්ත්වයන් සමාජ ස්තරායනයට හේතු වී ඇති බව නිගමනය කළ හැකි ය. දක්ෂ සාමාන්‍ය ජනයා ආරෝපිත සාධක අතික්‍රමණය කරමින් ප්‍රභූත්වයට පත් වීමෙන් හා ප්‍රභූන් අතර සිටින අදක්ෂයින් සාමාන්‍ය ජනයා බවට පත් වීම හෙවත් ප්‍රභූ සංසරණය (Circulation of elite) මගින් ඉහත නිගමනය තවදුරටත් තහවුරු වේ.

සමාජ ධුරාවලියෙහි මග නොහැරිය හැකි ලක්ෂණයක් ලෙස ස්තරායනය හැඳින්විය හැකි ය. සමාජ ස්තරායනය සමාජීය ලක්ෂණයක් ලෙස ස්ථාවර වී ඇති බැවින් සමාජයේ සෑම අංශයකට ම සම්බන්ධ වූ අනිවාර්ය සාධකයක් ලෙස ද හඳුනාගත හැකි ය. එබැවින් සමාජ සාමාජිකයා නිරන්තරයෙන් ඉහළ සමාජ ස්තරයක නියෝජිතභාවය ලබා ගනිමින් උඩුකුරු සමාජ සචලනයකට උත්සුක වනු දැකිය හැකි ය. අධ්‍යාපනය, එහිලා භාවිත කළ හැකි ප්‍රධාන ප්‍රවේශ දොරටුවක් ලෙස ද ලොව බොහෝ රටවල් විශ්වාස කරනු ලැබේ. මෙම ස්වභාවය හේතුවෙන් කලින් කලට, ප්‍රදේශයෙන් ප්‍රදේශයට, රටින් රටට හා කලාපයෙන් කලාපයට ස්තරායන රටාවේ විවිධත්වයක් ද දැකිය හැකි වේ.

වර්තමානයේ අධ්‍යාපනය විසින් සමාජ ස්තර උඩු යටිකුරු කරමින් පුද්ගලයාට අසීමිත ජීවිත අවස්ථා උදා කරමින් සිටියි. මේ අනුව නවීන ස්තරායන පද්ධතියට ප්‍රබල බලපෑමක් අධ්‍යාපනය

විසින් සිදු කරනු ලබයි. බැලන්ටයින් (Ballantine) පෙන්වා දෙන්නේ යහපත් අනාගතයක දොරටුව විවෘත කරන යතුර ඇත්තේ පාසල් බිත්ති ඇතුළත බවයි. මෙයට හේතු වී ඇත්තේ පාඨශාලීකරණය, රැකියා හා ආර්ථික සාර්ථකත්වය ලබා ගැනීමට බලපෑම් කරන හෙයිනි. (ජයසේන, 2010: 182). ශ්‍රී ලංකාවේ ද සමාජ ස්තර උඩුයටිකුරු වීම කෙරෙහි මෙම තත්ත්වය බලපෑම් සිදු කරන බව පැහැදිලි කරුණකි.

ශ්‍රී ලංකාව ද ඇතළත්ව ලොව බහුතරයක් රටවල අධ්‍යාපන ආයතන හා සමාජ ස්තරායනය අතර පවතිනුයේ ද සමාජ ස්තරායනයට අනුබල දෙන සබැඳියාවකි. ඒ අනුව ඉහළ සමාජ ස්තර නියෝජනය කරන්නන් හට වෙන් වූ අධ්‍යාපනික ආයතන පවතියි. එහෙත් පහළ සමාජ ස්තර නියෝජනය කරන්නන් හට ඔවුන්ට වෙන් වූ පහළ අධ්‍යාපනික ආයතන හරහා ඉහළ සමාජ ස්තරයන්ට වෙන් වූ ඉහළ පහසුකම් සහිත අධ්‍යාපනික ආයතන වෙත ප්‍රවිශ්ට වීමට යම් ප්‍රතිපාදන සුබ සාධන රාජ්‍යයන් හරහා සැකසී ඇත. එම අවස්ථාවන් හරහා පහළ සමාජ ස්තරයන් හි සාමාජිකයෝ ඉහළ සමාජ ස්තරයන් වෙත ගමන් කරති. මේ අනුව නිගමනය කළ හැක්කේ සමාජ ස්තරායනයට අනුබල දෙන ආධ්‍යාපනික ආයතන හරහා ම ඉන් විතැන් වීමට ද අවස්ථා උදාකර දී ඇති බවයි. එහෙත් එහි තීව්‍රතාව රඳා පවතින්නේ පුද්ගල විභව්‍යතාවන් හි ස්වභාවය මත වේ.

ලොව සෑම සමාජයක ම පාහේ අඩුවැඩි වශයෙන් ස්තරායනය ක්‍රියාත්මක වේ. ඒ ඒ ස්තරයට අනුව යම් යම් වරප්‍රසාදයන් ද භුක්ති විඳියි. ඒවායේ ප්‍රමාණාත්මක හා ගුණාත්මකභාවය, නියෝජනය කරන සමාජ ස්තරයට හා ඊට අනන්‍ය වූ ගතික ලක්ෂණයන්ට සාපේක්ෂව ඉහළ හෝ පහළ යාම ද සිදු වේ. නිදසුනක් ලෙස ශ්‍රී ලාංකික සමාජයේ කුලය පදනම් ව ගොඩනැඟුණු සමාජ ස්තරය භුක්ති විඳි වරප්‍රසාදයන් හි ඌනතා පැවතුනි. එම කුලයේ බලපෑම මර්ධනය කිරීමට බලපෑ හා බලපාන සාධක අතුරෙන් අධ්‍යාපනයට විශේෂ ස්ථානයක් හිමිවන බව ද සඳහන් කළ හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


ගලගමගේ, එස්. (2005). *අධ්‍යාපන සමාජ විද්‍යාව,* කර්තෘ ප්‍රකාශන.

ජයසේන, ඒ. (2010). *අධ්‍යාපන සමාජ විද්‍යාව,* ගොඩගේ ප්‍රකාශන.

රංජන්, පී. (2013). *අධ්‍යාපන ක්‍රියාවලියට සමාජ ස්තරායනය සම්බන්ධවන ආකාරය, අධ්‍යාපන සංවාද* - 05, කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමා (පූර්ණ කාලීන) විද්‍යාර්ථීන්ගේ වාර්ෂික අධ්‍යාපන සඟරාව.

රූපසිංහ, එස්. (1997). *අවාසිදායක පරිසරයන් හි අධ්‍යාපන අවස්ථා, අධ්‍යාපනය* - 27, ශ්‍රී ලංකා ජාතික අධ්‍යාපන සංගම් ප්‍රකාශන.

Andersen, Robert (2018). *social stratification*, Oxford bibliographies

Arum, R., Gamoran, A., & Shavit, Y. (2007). *More inclusion than diversion: Expansion, differentiation and market structures in higher education*. In Y. Shavit, R. Arum, & A. Gamoran (Eds.), *Stratification in higher education: A contemporary study* (pp. 1–35). Stanford: Stanford University Press.

Langman L. (1987). *Handbook of marriage and the family*, Springer (https://link.springer.com/article/10.1007/s10734-016-0016-x )

Marginsion, S. (2016). Published online: 2 June 2016 *The worldwide trend to high participation higher education: dynamics of social stratification in inclusive systems*, Springerlink.com

Paola, Urio (2013). Reinter venting Chinese society, *Economy and Polity: A very short history and interpretation of china's reforms. Plitics and society*, Vol.1 No 2)

Parsons, T. (1958). *American Sociological Review*, JSTOR